# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2087/89 – 2018 සැප්තැම්බර් 07 වැනි සිකුරාදා – 2018.09.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (1) වැනි වගන්තිය යටතේ ආඥාව අවලංගු කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 2049/7 හා 2017.12.11 වැනි දින දරන *රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 2017 අංක 322 හා 2017.11.27 වැනි දින දරන ආඥාවෙන් පහත උපලේඛනයේ වඩාත් සවිස්තර ලෙස දක්වා ඇති ඉඩම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ.

එනමුත් එහි භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින්, ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මාහට පැවරී ඇති බලතල අනුව අංක 2049/7 හා 2017.12.11 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 2017 අංක 322 හා 2017.11.27 දින දරන ආඥාව මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3-15/2017/වීඊ/314.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: කේයූඩීඑස්/එල්එන්ඩී/01/ඒසීකිව්/31.
2018 ජූලි මස 22 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරුවිට කෝරළේ - උතුරු උඩපත්තුව සුළු කොට්ඨාසයේ, ඉහළ පොහොරබාව ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක ආර්/කේආර්ඩබ්ලිව්/2017/685 හා 2017.10.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – පුස්සැල්ලවත්ත – ප්‍රමාණය: **හෙක්. 0.1672**

උතුරට සහ නැගෙනහිරට: හිමිකම සොයාගත නොහැකි පන්සල්වත්ත; දකුණට: මාර්ගය (ප්‍රා.ස.) සහ මාර්ගය (මා.සං.අ.); බටහිරට: මාර්ගය (මා.සං.අ.) හිමිකම සොයාගත නොහැකි පන්සල්වත්ත.

02. කැබලි අක්ෂර 'බී' – පුස්සැල්ලවත්ත – ප්‍රමාණය: **හෙක්. 1.9250**

උතුරට: මාර්ගය (ප්‍රා.ස.), ඩබ්ලිව්. ස්වර්ණලතා හිමිකම් කියන නුගහේන්යාය හෙවත් ජම්බුගහහේන, පුස්සැල්ල වැවිලි සමාගම හිමිකම් කියන පුස්සැල්ලවත්ත; නැගෙනහිරට: ඩබ්ලිව්. ස්වර්ණලතා හිමිකම් කියන නුගහේන්යාය හෙවත් ජම්බුගහහේන, පුස්සැල්ල වැවිලි සමාගම හිමිකම් කියන පුස්සැල්ලවත්ත; දකුණට: මාර්ගය, පුස්සැල්ල වැවිලි සමාගම සහ කාර්මික සංවර්ධන මණ්ඩලය හිමිකම් කියන පුස්සැල්ලවත්ත සහ මාර්ගය (මා.සං.අ.); බටහිරට: පුස්සැල්ල වැවිලි සමාගම සහ කාර්මික සංවර්ධන මණ්ඩලය හිමිකම් කියන පුස්සැල්ලවත්ත සහ මාර්ගය (මා.සං.අ.)

09 - 618


1A – G28477 – 12 (2018/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*